# සී/ස ලංකා නැව් සංස්ථාව

**(වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය)**

## ඇබෑර්තු

පහත සඳහන් තනතුරු සඳහා අදාළ සුදුසුකම් හා පළපුරුද්ද ඇති සුදුසු අයදුම්කරුවන් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1) සහකාර කළමනාකාර තනතුර– JM 1-2, II ශ්‍රේණිය (ඇබෑර්තු 01)

<u>අධ්‍යාපන සුදුසුකම්</u> :

**බාහිර අපේක්ෂකයින්:** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක කළමනාකරණය හෝ වාණිජ්‍ය ක්ෂත්‍රයෙහි උපාධිය

**හෝ**

වරලත් නැව් තැරැව්කරුවන්ගේ ආයතනයේ (එක්සත් රාජධානිය) (Chartered Institute of Shipbrokers (UK)) යෝග්‍යතා පරීක්ෂණයෙන් විෂයන් 03ක් සමත්වීම.

**අභ්‍යන්තර අපේක්ෂකයින් :** ඉහත බාහිර අපේක්ෂකයින්ට අදාළ වන්නා වූ සුදුසුකම්

**හෝ**

ආශ්‍රිත නිලධාරි (MA-3) කාණ්ඩයේ වසර පහක (05) සතුටුදායක සේවය සම්පූර්ණ කර තිබීම

**හෝ**

කළමනාකරණ සහකාර කාණ්ඩයේ MA 1-2 II ශ්‍රේණිය තනතුරක අවම වශයෙන් වසර (05) සතුටුදායක සේවය

**වැටුප් පරිමාණය :** JM 1-2 – 2016 : රු. (43,355 -10 ×755 -18× 1,135-71,335) සංශෝධිත වැටුප අනුව, 2020/01/01 දිනට JM 1-2 කාණ්ඩයේ II ශ්‍රේණියේ මූලික වැටුප රු. 43,355/- ක් වේ.

ඉහත වැටුපට අමතරව රජයට අයත් ව්‍යවසායන් සඳහා අනුමත අනෙකුත් අදාල දීමනා ගෙවනු ලැබේ.

## 2) ආශ්‍රිත නිලධාරි තනතුර - MA -3 III ශ්‍රේණිය (ඇබෑර්තු 06)

<u>අධ්‍යාපන සුදුසුකම්</u> :

**බාහිර අපේක්ෂකයින් :** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක ව්‍යාපාර කළමනාකරණය/ විද්‍යාව/ වාණිජ්‍ය/ අලෙවිකරණය/ නාවික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක්

**වැටුප් පරිමාණය :** MA-3 – 2016 : රු. ( 32,200-10×445-11×660-10×730-5×750-54,960) සංශෝධිත වැටුපට අනුව, 2020/01/01 දිනට MA -3 කාණ්ඩයේ III ශ්‍රේණියේ මූලික වැටුප රු. 32, 200/- ක් වේ.

ඉහත වැටුපට අමතරව රජයට අයත් ව්‍යවසායන් සඳහා අනුමත අනෙකුත් අදාල දීමනා ගෙවනු ලැබේ.

## 3) කළමනාකරණ සහකාර තනතුර - MA -1-2 III ශ්‍රේණිය (ඇබෑර්තු 03)

<u>අධ්‍යාපන සුදුසුකම්</u> :

**බාහිර අපේක්ෂකයින් :**

අ) අ.පො.ස.(සා.පෙළ) විභාගය එකවර විෂයන් හයකින් සමත් වී තිබිය යුතු අතර එම විෂයන් අතරින් පහත දැක්වෙන විෂයන්ද ඇතුළුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ තිබිය යුතුය.

I. සිංහල/දෙමළ
II. ගණිතය

**සහ**

ආ) අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබිය යුතුය.

**අභ්‍යන්තර අපේක්ෂකයින් :** ප්‍රාථමික අදියර(Primary Level) - පුහුණු - නුපුහුණු යන කාණ්ඩ වල සේවකයන් අතරින් පහත දැක්වෙන සුදුසුකම් ලාභීන් මේ තනතුර සඳහා අයදුම් කිරීම යෝග්‍ය වේ.

<u>අධ්‍යාපන සුදුසුකම් :</u>

අ.පො.ස.(සා.පෙළ) විභාගය එකවර විෂයන් හයකින් සමත් වී තිබිය යුතු අතර එම විෂයන් අතරින් පහත දැක්වෙන විෂයන්ද ඇතුළුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ තිබිය යුතුය.

I. සිංහල/දෙමළ
II. ගණිතය

**වෙනත් සුදුසුකම් :**

ඉහත රැකියා කාණ්ඩය යටතේ සංස්ථාවේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර 5ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**සටහන :** ස්ථිර තනතුරකට පත් කිරීමට පෙර, සපුරා ඇති කිසියම් සේවා කාලයක් හෝ ඕනෑම තනතුරක ස්ථිර පදනමේ තනතුරකට පූර්ව අවශ්‍යතාවයක් ලෙස සැපිරිය යුතු පුහුණුවීම් කාලයක් හෝ අනියම්/ තාවකාලික පදනමේ කිසියම් සේවා කාලයක් ඉහත සඳහන් කොට ඇති වසර 5ක සේවා කාල සීමාව තුලට ගණන් නොගත යුතුය.

**අභ්‍යන්තර හා බාහිර අපේක්ෂකයින් සඳහා වූ වෙනත් සුදුසුකම් (සාමාන්‍ය)**

- ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව
- පරිගණක සාක්ෂරතාවයේ නිපුණතාවය

**වැටුප් පරිමාණය :** MA 1-2 - 2016 : රු. (27,910-10×300-7×350- 12×600-12×710-49,080) සංශෝධිත වැටුප අනුව, 2020/01/01 දිනට MA 1-2 කාණ්ඩයේ III ශ්‍රේණියේ මූලික වැටුප රු. 27,910 /- ක් වේ. ඉහත වැටුපට අමතරව රජයට අයත් ව්‍යවසායන් සඳහා අනුමත අනෙකුත් අදාල දීමනා ගෙවනු ලැබේ.

## 4) තොරතුරු තාක්ෂණ සහකාර තනතුර - MA 2: 1 - IIIශ්‍රේණිය - (පුරප්පාඩු 01)

<u>අධ්‍යාපන සුදුසුකම්</u> :

**බාහිර අපේක්ෂකයින් :** වෘත්තිය : පරිගණක දෘඩාංග, පරිගණක ජාල, විදුලි හා ඉලෙක්ට්‍රොනික ක්ෂේත්‍රයන් හී තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (5) වැනි මට්ටම ට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අපේක්ෂකයින්:** ඉහත බාහිර අපේක්ෂකයින්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

හෝ

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද පරිගණක දෘඩාංග, පරිගණක ජාල, විදුලි හා ඉලෙක්ට්‍රොනික යන ක්ෂේත්‍රවල ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතර (4) මට්ටම ට නොඅඩු ප්‍රවීණතා සහතිකය ලබාගෙන වසර 03 ක සේවා පළපුරුද්දක් තිබීම.

**වැටුප් පරිමාණය :** MA 2-1 – 2016 : රු. ( 30,310-10×300-07×350-4×495-20×660-50,940) සංශෝධිත වැටුපට අනුව, 2020/01/01 දිනට MA 2-1 කාණ්ඩයේ III ශ්‍රේණියේ මූලික වැටුප රු. 30, 310/- ක් වේ.

ඉහත වැටුපට අමතරව රජයට අයත් ව්‍යවසායන් සඳහා අනුමත අනෙකුත් අදාල දීමනා ගෙවනු ලැබේ.

### <u>පොදු කොන්දේසි</u>

**වයස් සීමාව:** වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය.
ඉහළ වයස් සීමාව අභ්‍යන්තර හා අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**බඳවාගැනීමේ ක්‍රමවේදය :** පත්කිරීමේ බලධාරියා විසින් පත්කළ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන තරඟකාරී ලිඛිත විභාගය සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

**පරිවාස කාලය :** අවුරුදු 03 කි.

**ප්‍රතිලාභ**

1. සේ.අ.අ. / සේ.නි.භා.අරමුදලට සංස්ථාවේ දායකත්වය
2. නේවාසික හා බාහිර ප්‍රතිකාර සඳහා ශල්‍යකර්ම හා රෝහල්ගත කිරීම් සඳහා රක්ෂණ ආවරණය
3. සම්පූර්ණ පුද්ගල සහ අනතුරු රක්ෂණ ආවරණය
4. භාවිතා නොකල වෛද්‍ය නිවාඩු වලට ගෙවීම්
5. වාර්ෂික ප්‍රසාද දීමනා අදාල පරිදි
6. සහනශීලී නියමයන් මත නිවාස ණය සහ සේවක මණ්ඩල ණය
7. සහනශීලී අනුපාත මත වාහන ණය

**<u>සෑම අයදුම්කරුවෙකුම</u>**

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය
- ඕනෑම අංශයක සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය
- විශිෂ්ට චරිතයකින් යුක්ත වීම

### <u>පොදු උපදෙස්</u>

- සියලුම අයදුම්පත් තමා විසින් සත්‍ය බවට සහතික කළ අධ්‍යාපන / වෘත්තීය සහතිකපත්වල පිටපත් සමඟ උප්පැන්න සහතිකයේ සහ අනෙකුත් සහතිකවල පිටපත් සහ තමන් පිළිබඳ විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්ද සහිතව **ලියාපදිංචි තැපෑලෙන් සැප්තැම්බර් මස 29 හෝ එදිනට පෙර සභාපති, සී/ස ලංකා නැව් සංස්ථාව, අංක 27, MICH ගොඩනැගිල්ල, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් මාවත), කොළඹ 01** වෙත ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්පත එවන ලිපිකවරයේ වම්පස ඉහල කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කර තිබිය යුතුය.
- රාජ්‍ය අංශයේ ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.
- ප්‍රමාද වී ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත් පිළිබඳ සලකා බලනු නොලැබේ.
- පත්කිරීම් බලධාරියා විසින් පත් කරන ලද මණ්ඩලයක් විසින් පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී අයදුම්කරුවන් ඇගයීමට ලක් කරන බව කරුණාවෙන් සලකන්න.

**ඉහත අවශ්‍යතාවන්ට අනුකූල නොවීම අයදුම්පත ප්‍රතික්ෂේප වීමකට හේතු විය හැකිය. යම් ආකාරයක බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.**

---

**සභාපති**
**සීමාසහිත ලංකා නැව් සංස්ථාව**
**අංක 27, MICH ගොඩනැගිල්ල**
**ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් වීදිය)**
**කොළඹ 01**

2020.09.16

Source: www.cscl.lk (2020.09.19)